// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2089/12 - 2018 සැප්තැම්බර් මස 17 වැනි සඳුදා - 2018.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

49"ඒ " වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තිය සමග කියැවෙන ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 49"ඒ " වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, මලික් සමරවික්‍රම වන මවිසින් 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යයන් සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති ඉඩම අවශ්‍ය බව මෙම නියෝගයෙන් ප්‍රකාශ කර සිටිමි.

**මලික් සමරවික්‍රම,**
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.


**උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුව, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආරබොක්ක ගමෙහි ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එස්. ආර්. ඉලේපෙරුමච්චි මහතා විසින් මැන පිළියෙල කරන ලද 2016.01.22 දිනැති අංක S/Mis/450 දරන පිඹුරෙහි කැබලි අංක 4 මගින් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 77.36 (අක්. 191, රූ. 00, පර්. 25)ක් වූ ඉඩම් කොටසෙහි මායිම් පහත පරිදි වේ.

**කැබලි අංක : 4**

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 3, අධිවේගී මාර්ගය සහ කැබලි අංක 5 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 5, |
| *දකුණට* | : | කැබලි අංක 5, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම සහ කැබලි අංක 3, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 3. |

*ප්‍රමාණය* : හෙක්. 77.36 (අක්. 191, රූ. 00, පර්. 25)






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.